# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,893 — 1970 පෙබරවාරි 13 වැනි සිකුරාදා — 1970.2.13

(ලංකාණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# V කොටස—කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුව

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## වර්ෂ 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත

### කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම්පත

වර්ෂ 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනතෙහි 87 (4) දරණ ඡේදය අනුව, කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම උදෙසා මගීන් ගෙන යාමේ බලපතක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති පහත දැක්වෙන අයදුම් පත සම්බන්ධව වර්ෂ 1970 මාර්තු 9 වෙනි දින පෙරවරු 11 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වෙන බැව් මෙයින් නිවේදනය කරමි.

2. ඉහත දැක්වෙන බලපත්‍රය නිකුත් කිරීම ගැන නීත්‍යානුකූලව විරෝධය පළකොට ඇති අයවලුන් සහ අයදුම්කරු හැර අන් කිසිවකුට ප්‍රසිද්ධ පරීක්ෂණයකදී කරුණු ඉදිරිපත් කිරීමට අයිතියක් නැත.

3. එහෙත් කොමසාරිස් තැනට ස්වකීය අභිමතය පරිදි ඉහත (2) ඡේදයෙහි සඳහන් ඕනෑම කෙනෙකුහට ප්‍රසිද්ධ පරීක්ෂණයකදී කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ සැලසිය හැක.

4. යම් පුද්ගලයෙකුගේ අදහස් වෙනයම් පුද්ගලයකු විසින් එම පරීක්ෂණයේදී ඉදිරිපත් කොට ඇතැයි කොමසාරිස්තැනට ඒත්තු ගියහොත් ස්වකීය අභිමතය පරිදි, එවැනි ඕනෑම පුද්ගලයෙකුගෙන් කරුණු ඇසීම කොමසාරිස් තැනට ප්‍රතික්ෂෙප කළ හැක.

1970 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ 5, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දී ය.

ඩී. ආර්. සී. හන්වැල්ල,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්.

| අනුක්‍රමික අංකය | අයදුම්කරුගේ නම සහ ලිපිනය | යෝජිත මාර්ගය |
|---|---|---|
| ඒබී. 2122 ... | ඩබ්ලිව්. ජේ. සිරිසේන මහතා, ගොඩපොල වත්ත, මැදවල ... | මහනුවර-දොරනෑගම, කටුගස්තොට රනවන ඔස්සේ |

2–421

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1——ජේ 69602—550 (70/2)

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එයි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියලුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 70. 1. 2 | සිකුරාදා ... | 69.12.26 | සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 1. 9 | සිකුරාදා .. | 70. 1. 2 | සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 1.16 | සිකුරාදා ... | 70. 1. 8 | බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 1.23 | සිකුරාදා ... | 70. 1.16 | සිකුරාදා | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 | බ්‍රහස්පතින්දා . . | 70. 1.21 | බදාදා | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි .. | 70. 2. 5 | බ්‍රහස්පතින්දා .. | 70. 1.28 | බදාදා | ප.ව. | 3.30 |
| | 70. 2.13 | සිකුරාදා . | 70. 2. 5 | බ්‍රහස්පතින්දා | පෙ.ව | 12.00 |
| | 70. 2.20 | සිකුරාදා .. | 70. 2.13 | සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 2.27 | සිකුරාදා ... | 70. 2.20 | සිකුරාදා | පෙ.ව. | 12.00 |
| මාර්තු . | 70. 3. 5 | බ්‍රහස්පතින්දා ... | 70. 2.27 | සිකුරාදා | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 | සිකුරාදා ... | 70. 3 5 | බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70 3.20 | සිකුරාදා ... | 70. 3.13 | සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 3.26 | බ්‍රහස්පතින්දා ... | 70. 3.20 | සිකුරාදා | ප.ව. | 3.30 |

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.